


සිසිර දිසානායක

# යෞවන ලංකා

''සිරිපා පියුමේ - රොන් සුණු තැවරෙන්නේ'' මහගමසේකර මහත්තයා ලියපු පද කීපයක් අමරදේවතුමා වාගේ ගයන්න පින්සල උත්සාහ කළා.

''හපෝ ඇති ඇති'' පන්හිඳ කන් දෙකේ ඇඟිලි ගහගත්තා.

''ඉරිසියාව ෟ ඉරිසියාව ෟෟ තමුන්ට බෑනේ... ඉතින් ඉරිසියාවෟ '' පින් කිව්වා.

''මොකද බැරි? මටත් හොඳට සින්දු කියන්න පුළුවනි. හැබැයි ඉතින් අනික් අයට අහගෙන ඉන්න තමයි බැරි'' පින් ඇත්තම කිව්වා.

''ඇත්ත තමයි සින්දු කියන්න පුළුවන් වුණාට ගායනා කරන්න බෑනේ. ඒක වෙනම කලාවක්.''

''අපි ලංකාවට ගිය ගමන මතක් වුණා. මතකද එදා අහස හරි පැහැදිලි ලස්සන උදයක්. අහස් යාත්තරාව කතරගම පැත්තෙන් ලංකාවට ඉහලින් අහසේ ඇතුල් වෙලා කටුනායකට බස්සවනකල් ගතවුණ විනාඩි විස්ස විසිපහ? ඔය සේකර උන්නැහේට ''සිරිපා පියුමේ'' ගීත සංකල්පනාව පහළ වුණාය කියන්නෙත් ඔය වාගේ ගමනකදී සිරි පාදේ හරියෙන් අහස් යත්තරාවේ යනකොටලුනේ...'' පින් තමන්ගේ ඇසූ විරූ තැන් දිග හැරියා.

''අපේ ලංකා ගමන ගැන සටහනක් කිව්වොත් හොඳා'' පින් කල්පනා කලා.



මේ කාලය වනවිට මව්බිය යළිඳු යුද මානසිකත්වයට යොමු වී තිබිණ. සටන් පෙරමුණුවල හමුදාවෝ සතුරු ඉලක්ක කරා මුලින්ම ගුවන් ද දෙවනුව බිමින්ද පහර එල්ල කිරීමෙහි යෙදී සිටියාහ. ත්‍රස්තයින්ගේ යැයි සැකකළ හැකි නෞකාවකට ගුවනින් එල්ල කරන ලද ප්‍රහාරයේ දර්ශන පෙළක් උනුසුම් ප්‍රවෘත්තියක් සේ දිග හැරෙන්නට පළමුව සංස්කරණයෙන් තොරවම දැක ගන්නට ද අවස්ථාව හිමිවිය.

දැන හැඳුනුම්කම් ඇති හමුදා නිලධාරීන් හා අල්ලාප සල්ලාපයෙහි යෙදෙන්නට ලද අවස්ථාද කීපයක්ම වීය. තරුණ හමුදා නිලධාරීන් මෙන්ම සෙබලුන්ද නව පණක් ලද්දවුන් සේය අදහස් දැක්වූයේ.

''අපට දැනුම, ශක්තිය තියෙනවා. ආම්පන්න තියෙනවා. හිත තියෙනවා. දැන් අපිට අවසරයක් තියෙනවා. ඒ දවස්වල අපට මේ ඔක්කොම තිබුණත් අවසරයක් තිබුණෙ නෑ. කෑම්ප්වලට ගාල් වෙලා ඉඳලා එයාලා ගහන කොට නිකම්ම මැරිලා යනවා. අපේ පුහුණුව, අවි ආයුද, ජීවිත නිකම්ම කාබාසිනියා වෙලා යනවා....''

අපේ තරුණයින් හරි එඩිතරයි. උනන්දුයි. දැන් බලන්න, අපේ ඉලක්කවලින් කීයද වැරදුණේ කියලා...''

මෙවර ලිපියෙන් යුද වාතාවරණය පිළිබඳව දිගින් දිගටම සටහන් තැබීම අපගේ අරමුණ නොවේ. එසේ වුවද අගනුවර එදිනෙදා ජන ජීවිතය පිළිබඳව යමක් ලිවිය යුතුවන්නේය. මෙරට වාසී බොහෝදෙනෙකු සිතනා පරිදි බියෙන් ඇළලී ගත් නිවට රැළක් සේ සියලු කටයුතු නවතා නිවෙස් හි දොරගුළුලාගත් කිසිවෙකු අගනුවර මතු නොව යාපන අර්ධද්වීපයෙහිවත් ඇතියැයි සිතිය නොහේ. ඉදිරි තත්පරයේදී තමන් පාමුල අති බිහිසුණු බෝම්බයක් පිපිරී යා හැකි වුවද මේ තත්ත්පරයේදී සෑම සියලුදෙනාම තමන්ගේ කටයුතුවල සුපුරුදු ලෙස නියැලී සිටිති. ශ්‍රී ලංකා පොලීසිය හදිසියේ කරන වැටලීම්, පරීක්ෂා බැලීම් අගනුවරුන්ට මහත්ම සැනසිල්ලක් වී ඇත. එබඳු වැටලීමකදී ඇතිවන අධික වාහන තදබදය ඇතැම් විට හෝරා තුන හතර දක්වා පැවතීමයි ප්‍රධානතම හිරිහැරය. සියල්ල උපේක්ෂාවෙන් විඳ දරා ගැනීමට සිදුවී ඇත්තා සේය. ජංගම දුරකථනවල පිහිටෙන් බොහෝ අය සිය කටයුතු නැවත සැළසුම් කරගනු දක්නට ලැබිණ. පාසැල්වලට පවා එවන් අවස්ථාවන්හි කටයුතු කළයුතු ආකාරය දැනුවත් කර ඇති අතර මෙකී තත්ත්වයන් දරුණු ලෙස බලපානු ඇත්තේ රෝහල්ගතව වෛi ප්‍රතිකාර ලබන අසාධ්‍ය රෝගීන්ටය.

මව්බිමෙහි ගෙවුණා වූ සති කීපය තුළ දැකිය හැකි වූ ප්‍රවණතාවයන් අතරින් යෞවන යෞවනියන් හා සබැඳුණා වූ හරයන් කීපයක් පිළිබඳව සටහන් තැබීම අගනේ යැයි හැඟේ. මෙවරද වාර්ෂිකව බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ පවත්වන්නට යෙදෙන පොත් සල්පිල සතියක් පුරාවට ඉහළින්ම පැවැත්විණ. අතිවිශාල පාඨකයින් සමූහයක් එම පරිශ්‍රය සිසාරා සරමින් නොයෙකුත් පොත් තෝරමින් සිටිනා දර්ශනය සැමතින්ම සුභ දසුනක් විය. මේ අතරේ වැඩි වශයෙන්ම දක්නට ලැබුණේ තරුණ තරුණියන් වීමයි විශේෂත්වය. පාසැල් වේලාවෙන් පසු පාසැල් යන දූ දරුවන්ගෙන් එම අලෙවි සැල් පිරී ඉතිරී යනු දක්නට ලැබිණ. සැබැවින්ම මෙපමණටම කියවීමේ රුචිය වර්ධනය වී ඇත්නම් රටේ මතු ප්‍රවර්ධනය සඳහා දකින සුබ සිහින සැබෑවීමේ පෙර නිමිත්තක් නොවේද මේ?

''ඉස්සර විටින් විට පොත් ගන්න ගියාට, දැන් කරන්නෙ සල්ලි එකතු කරගෙන ඕන තරක පොත් ලැයිස්තුවක් හදාගෙන ප්‍රදර්ශනේට යන එකයි. ලාබෙට ගන්නත් පුලුවන්නෙ. අගනුවරින් බැහැරක වෙසෙන විශ්‍රාමික ගුරුපියාණන් කෙනෙකුගේ අදහසයි ඒ.

''ඒකත් දැන් රැල්ලක් වෙලා. ඔය තරමට කියවනවටම නෙවිෟ'' තදබදය ඉවසා ගත නොහුණු වැඩිහිටියෙකුගේ නෝක්කාඩුවය ඒ.

තරුණ තරුණියන් ආගමික කටයුතු වෙත යොමුවීමද කලික් කල දක්නට ලැබෙන්නෙකි. පූජ්‍ය පානදුර අරියධම්ම හිමි, පූජ්‍ය සෝමහිමි වැනි දේශකයාණන් වටා වැඩිපුර එක් වූයේ තරුණ කැළ නොවේද? බණ භාවනාවන්හි යෙදෙමින් ප්‍රතිපත්ති පූජා මුල් කරගෙන කටයුතු කෙරෙන තරුණ පරපුරක නිදසුන් කීපයක්ම මුණගැසීමට ලැබීම මහත් වූ පුණ්‍ය කර්මයක් වීය. ඔවුන්ට අනුව තරුණ පිරිස් සාමූහිකව සංවිධානය වී කරගෙන යන්නා වූ ශීල ව්‍යාපාරයන් බොහෝය. ඊටම යාව ආමිස පූජාවන්හි නිරතවන්නන් ද නැත්තේ නොවේ. ආදී නාලන්දීය බෞද්ධ ශිෂ්‍ය සංගමය මේ වනවිට අනෙකුත් බෞද්ධ විා්‍ලයන්හි ආදි ශිෂ්‍යයින් හා අත්වැල් බැඳගෙන සිටියි. බුද්ධ වර්ෂ 2550 සපිරුණ පසුගිය වෙසක් පුන් පොහෝදා ප්‍රවීන ශිල්පී ශිල්පිනීන්ගේ හඬින් ගැයුණ ''ගී බුදු සමර'' බොදු ගී එකතුව ජනපති අත පත්ව බොදු දනන්ට පිළිගැනුන අගනා තිළිණයකි. මිෂනාරී දහම ලක්දිව පැතිරී පැවැති යුගයේ පැවැත්වීමට යෙදුණා වූ ආගම් වාද හා අන්තර්ගතය අධ්‍යයනය කරමින් ඔවුන් ගෙන යන වැඩපිළිවෙළ මතු පරපුර සඳහායි. අන්‍යාගමික කරණය පිළිබඳවද ඉතා සංවේදීය ඔවුන්.

ජන සංගීතය ඇසුරින් අගනා නව නිර්මාණ රැසක් ඉදිරිපත් කළ අභාවප්‍රාප්ත ලයනල් රන්වල සංගීතවේදියාණන් විසින් මුල පිරූ කටයුතු තවදුරටත් වර්ධනය කරමින් ඉදිරියට ගෙන යන තරුණ කැළකි ''ලයනල් රන්වල ජන ගී කණ්ඩායම''. ''මතු පරපුර'' නමින් ඔවුන් විසින් නංවා ගෙන ඇති කුඩා දරු දැරියන්ගෙන් සපිරි කණ්ඩායම මේ වනවිටත් කුසලතාවයන් හා ලබා ඇති ශිල්පීය දක්ෂතා අතින් අන් අයට දෙවැනි නොවේ. සංගීතය, ගායනය, රංගනය, නර්තනය, ප්‍රසාංගික කලාව යන අංගනයන්ගේ සම්මිශ්‍රනයෙන් ''අපේ දේ'' ලෙයට කැවීමේ මෙම මහඟු සද්කාර්යයේ නියමුවා නම් සහන් රන්වල තරුණයායි. බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේ පැවැත්වෙන පාඨමාලාව මෙන්ම, දිවයින පුරා පැවැත්වෙන දේශන, වැඩමුළු, ''ගම අවුලඤද්ඤදං'' ජන ගී ප්‍රසංගය, මාධ්‍ය හරහා කෙරෙන වැඩසටහන් අද දිවයිනෙ ජනප්‍රිය අංගයක් වී ඇති සේ පෙනෙයි. තෙවන වරටත් මාතර දී පැවැත්වුණ ජන ගී ප්‍රසංගයේ දර්ශන වාර දෙකම රසිකයින්ගෙන් පිරීයාම ඊට කදිම නිදසුනක්. තමන්ගේ දේ රකින්නත් රැකීමේ භාරදූර වගකීම භාර ගන්නා මාතර දිසාපතිවරයා වැනි

11 වන පිටට

TAX RETURNS
BAS & IAS
Bookkeeping
Tax Planning
Business Consultants

Sandal Financial & Tax Advisors

Amal Ramyanath
No. 47 Cypress Avenue
Glen Waverley
Vic 3150
* Special offer for Families

Phone: (03) 8802 8818
Fax: 8802 8818 Mob: 0412 775 889
Email: sandalmanagement@optusnet.com.au